ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොන්සල් ජනරාල් කාර්යාලය
මෙල්බර්න් ඕස්ට්‍රේලියාව

இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் கொன்சுலர் ஆதிபதி அலுவலகம்
மெல்போர்ன் அவுஸ்ட்ரேலியா

THE CONSULATE GENERAL OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA
MELBOURNE AUSTRALIA

Telephone: (03) 9290 4200, (03) 9290 4201
Fax: (03) 9867 4873
Email: mail@slcgmel.org
Website: www.slcgmel.org

Suite 536, No.1, Queens Road,
Melbourne, VIC 3004, AUSTRALIA

Recognition of 2016 VCE High Achievers of Sri Lankan origin at the Commemoration of the 69th Anniversary of the Independence of Sri Lanka

The Consulate General of Sri Lanka in Victoria requests nominations of those who have achieved following results at the 2016 VCE examination;

1. ATAR score of 95 or above to be considered for the top 10 VCE High Achievers' Awards.
2. Study score of 40 or above for Sinhala Language to be considered for the Highest Achiever for Sinhala Language Award, and
3. Study score of 40 or above for Tamil Language to be considered for the Highest Achiever for Tamil Language Award

The awards will be presented at the Commemoration of the 69th Anniversary of the Independence of Sri Lanka to be held on the 4th of February 2017 at 'Box Hill Town Hall', 1022, Whitehorse Road. Box Hill, VIC 3128.

Please call **(3) 92904210** or **0415200196** or send an email to mail@slcgmel.org to obtain nomination form and further details.

Duly completed nomination forms should be received by the Consulate General by **5.00pm on Sunday the 15th of January 2017**.

Consulate General of Sri Lanka
Melbourne
25/11/2016

ශ්‍රී ලංකාවේ 69වෙනි නිදහස් සමරු උළෙලේ දී VCE විභාගයෙන් උපරිම සමත්කම් දැක්වූ ශ්‍රී ලාංකික සම්භවයක් ඇති සිසුන් පිළිගැනීමට ලක් කිරීම

වික්ටෝරියාවේ කොන්සල් ජනරාල් කාර්යාලය 2016 VCE විභාගයෙන් පහත දැක්වෙන ඇත්දමින් සාමාර්ථයක් ලැබූ සිසුන් හට අදාල ප්‍රදානයන් සඳහා අයදුම් කරන මෙන් ඉල්ලා සිටී.

1. ATAR ලකුණු සංඛ්‍යාව 95 ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇතිනම්, VCE විභාගයෙන් උපරිම සමත්කම් දැක්වූ සිසුන් 10 දෙනා හට පිරිනැමෙන ප්‍රදානයන් සඳහා
2. සිංහල භාෂාව සඳහා ලකුණු සංඛ්‍යාව 40 ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇතිනම්, සිංහල භාෂාව සඳහා උපරිම සමත්කම් දැක්වූ සිසුවාට පිරිනැමෙන ප්‍රදානය සඳහා, සහ
3. දෙමළු භාෂාව සඳහා ලකුණු සංඛ්‍යාව 40 ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇතිනම්, දෙමළු භාෂාව සඳහා උපරිම සමත්කම් දැක්වූ සිසුවාට පිරිනැමෙන ප්‍රදානය සඳහා

2017 පෙබරවාරි 4 වෙනිදා 1022, Whitehorse Road, Box Hill, VIC 3128 හි 'Box hill Town Hall' හිදී පැවැත්වෙන ශ්‍රී ලංකාවේ 69 වෙනි නිදහස් සමරු උළෙලේදී මෙම ප්‍රදානයන් පිරිනැමෙනු ඇත.

අයදුම්පත් හෝ වැඩි විස්තර (3) 92904210 හෝ 0415200196 අමතමින් හෝ, mail@slcgmel.org වෙත විද්‍යුත් පිටපතක් යොමු කිරීමෙන් ලබා ගතහැක.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017 ජනවාරි 15 වෙනි අරුදා ප.ව. 5 ට පෙර කොන්සල් ජනරාල් කාර්යාලය වෙත ලැබීමට සලස්වන්න.

Consulate General of the Democratic Socialist Republic of Sri Lanka
Suites 536,542 and 544, 1 Queens Road, Melbourne, Victoria 3004
Tel: (03) 9290 4200, (03) 9290 4201 Fax: (03) 9867 4873 E-mail: mail@slcgmel.org

Nomination for Top 10 VCE High Achievers 2016 Awards

The Consulate General of the Democratic Socialist Republic of Sri Lanka in Victoria requests nominations of those who have achieved ATAR score of 90 or above from the 2016 VCE examination to be considered for the top 10 VCE High Achievers Awards.

The awards will be presented at the Commemoration of the 69th Anniversary of the Independence of Sri Lanka to be held on the **4th of February 2017** at 'Box Hill Town Hall', 1022, Whitehorse Road. Box Hill, VIC 3128.

To be considered for the awards, a duly completed nomination form with a certified copy of ATAR score sheet should be sent by post, fax or email to the Consulate General by **5.00pm Friday 13, January 2017.**

Selection Criteria:

1. Only the students with Sri Lankan origin are eligible to apply.
2. To be considered for the awards, the Students must have an ATAR score of 90 or above from the VCE examination held in 2016.
3. Top ten nominees with maximum ATAR scores among the nominations received as per the above guidelines will be selected for the awards after verification of the scores.
4. Decision of the selection panel will be final and conclusive.

Nomination Form

Full Name of the nominee				
Address				
	Suburb		Post Code	
Telephone Number	Home		Mobile	
Email Address				
School				
ATAR Score				
Parent/Guardian	Name			
	Address			
	Suburb		Post Code	
	Contact Numbers			

Certified Copy of ATAR Score sheet attached? ☐ YES ☐ NO

Signature of the Nominee
Date:.....

Signature of the Parent/Guardian
Date:.....

35 වන පිටෙන්

ප්‍රහාරවල යෙදුණු සටන්කාමීන්ට සහ සහායක බලකායට මඟ පෙන්වන්නන් ලෙස එසේ ආයුධ පුහුණුව ලැබූ-වන්ගේ සේවය ලබාගත්තේය. සමහර අවස්ථාවල ඔවුන්ව මුරකාවල් කටයුතුවලද යෙදවීවේය. මෙසේ කටයුතු කළ ජනයාගෙන් සමහරු ප්‍රහාරවලදී මිය ගියහ. ඔවුන් වෙනුවෙන් සටන් පෙ-රමුණේ දිවි පිදූ සටන්කාමීන්ට හිමි ගෞරවයම ලබාදුන් අතර, ඔවුන්ගේ පවුල්වලට මූල්‍යාධාර සුළු පමණින් හෝ ලබාදෙන මෙන් නායකතුමාට බල කරන්නට වූවේය. සංවිධානයෙහි ඉතිහාසය තුළ කිසිම බලහත්කාරයකින් තොරව පළමු වතාවට ජනතාවගේ කැමැත්තෙන් සහ දායකත්වයෙන් මහජන බලකායක් ගොඩනැගූ වීර සෙන්පති ලුතිනන් කර්නල් අන්බු 1993 වසරේදී පුනගරි සටනේදී දිවි පිදුවේය. සිංහල දෙමළ මාලු ගම්මානවල වාසය කළ දෙමළ ජනයාගේ ජීවිත ආරක්ෂා කිරීමේදී පුළුල් ලෙසින් කටයුතු කළ යුතු අතර, හමුදාවේ සහායෙන් සිදු කෙරෙන සිංහල ජන-පදකරණය නතර කිරීමෙහිත් ඔහු සිදුකළ කාර්යභාරය දෙමළ ජනතාවගේ ඉතිහාසයේ සදා නොමියෙනු ඇත.

''ජය සිකුරු'' හමුදා මෙහෙයුම් සිදු කෙරුණු කාලයේදී වන්නියේ නැවතත් එවැනි ජනතා හමුදා ව්‍යුහයක් ඇති කිරීම සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක විය. එය ''එල්ලෙප්පලෙ'' (සීමා බලකාය) යන නමින් දේශපාලන අංශයෙහි තනි පරිපාලන ඒකක ලෙස ක්‍රියාත්මක විය. එම බලකාය සඳහා වන පුහුණු කඳවුරු ඇති කළේය. මෙහි ආරම්භක වැඩසටහන පුදුකුඩියිරප්පු මාලතී ක්‍රීඩාංගනයේදී කොටි ධජය ඔසවා සිදු කළේය. මමද එම වැඩසටහනට සහභාගී වූවෙමි. මට මගේ දෑස් අදහා ගත නොහැකි තරමට දහස් ගණන් ජනයා පෙළ ගැසී උන්නේය. එවක ''ජය සිකුරු'' සටන් පෙ-රමුණේ ප්‍රධාන සේනාධිනායක ලෙස කටයුතු කළ කරුණා අම්මාන් විසින් කොටි ධජය ඔසවා එම උත්සවය ආරම්භ කරන ලදි. දේශපාලන අංශයෙහි වැඩ සැළැස්මට අනුව ''විප්ලවවාදී මාමිගේ රතු හමුදාව'' වැනි ජනතා හමුදාවේ නායක ප්‍රභාකරන්ගේ හමුදා ප්‍රහාර සඳහා පාර්ශ්වය ආධාරක බලකායක් බිහි කිරීම එහි අරමුණ විය.

ජනතාවගේ දෛනික ජීවිතය සඳහා වන සියලු මාර්ග අවහිර කිරීමට ලක්ව තිබුණු යුද්ධමය වාතාවරණය තුළ කැමැත්තෙන් හෝ අකමැත්තෙන් හෝ කොටින්ගේ බසට අවනතව කටයුතු කිරීම හැර ජනතාවට විකල්පයක් නොවීය. එම කාලවකවානුවෙහි දී මම ද ප්‍රචාරක කටයුතුවල යෙදෙන සටන්කාමී සාමාජිකාවක් ලෙසින් මෙම වැඩසටහන්වලට මහත් උනන්දුවෙන් සහභාගි වෙමින් සිටියෙමි. ජනතාවගෙන් ඉතාමත් සුළු කොටසක් පමණක් සැබෑ කැමැත්තකින් යුතුව පුහුණුව ලබා ''සීමා බළකායට'' එක්ව සටන් පෙරමුණට යෑමට සූදානමින් උන්නේය. ජනතාවගෙන් බහුතරය නොවැළැක්විය හැකි නිසාම කැමැත්තෙන් කටයුතු කරන බවක් අඟවා කටයුතු කළෝය. තවත් සමහරු සෘජුවම විවේචනය කර ගැටුම් ඇතිකරගත් අතර, බැණ වැදුණහ. එහෙත් ඉතාමත් දැඩි ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ හෙයින් සියලු දෙනාම පුහුණුව ලැබිය යුතු අනිවාර්ය තත්ත්වයක් ඇති කළේය. සංවිධානය, පිරිස් බල හිඟයකට මුහුණ දී සිටින තත්ත්වයක් තුළ කොටි සංවිධානය විසින් අත්පත් කරගන්නා ලද ප්‍රදේශවල ''සීමා බළකාය'' රැඳවා තැබීමෙන් එම ප්‍රදේශ අහිමි වීමට ඉඩ නොදී ආරක්ෂා කරගත හැකි බවත් එමගින් ලංකාවේ ආණ්ඩුව තුළත් හමුදාව තුළත් මානසික අර්බුදයක් ඇති කළ හැකිය යන්නත් සංවිධාන නායකත්වය බලාපොරොත්තු විය. ඒ සියල්ලන්ටත් වඩා විමුක්ති කොටින්ගේ අරගලය යනු මහජන අරගලයක්ය යන්න ජාත්‍යන්තරයට පෙන්වාදීම මෙම වැඩසටහනෙහි අරමුණ විය.

ජනයා සියලු දෙනාම පුහුණු පිටියට පැමිණිය යුතුමය. වයොවෘද්ධයෝ, හදවත් රෝගීහු, ආබාධිතයෝ, ගර්භිණී මවුවරු, කිරිදෙන මවුවරු සහ වෙනත් බරපතල වෛද්‍ය හේතු සහිත අයට පමණක් මෙම පුහුණුවට සහභාගි නොවී සිටිය හැකි විය. අනෙකුත් සියලු දෙනාම අදාළ පුහුණුව ලබා එය සහතික කරන හැඳුනුම්පත ලබා ගත යුතුය. එම හැඳුනුම්පත නොවෙති අයකුට ග්‍රාමසේවකගෙන් කිසිම ආධාරයක් ලබා ගැනීම කළ නොහැකි වන ලෙසට බාධා පමුණුවා තිබුණි. එහෙයින් කළ හැකි දෙයක් නැති නිසාම ජනතාව පුහුණුවට සහභාගි වූහ. මගේ මව පවා උදලු මිටක්ද සහිතව සවස් කළ පිට්ටනියට ගොස් පුහුණුව ලබා පැමිණියාය. අම්මාගේ දණහිස්වල ඉදිමුමක් සහ වේදනාවක් තිබුණු හෙයින් පිට්ටනිය වටා ගමන් කරන මෙන් තම පුහුණුකරු පැවසූ බව අම්මා කීවාය.

වන්නියේ සටන් පෙරමුණු කීපයකම එවිට යුද්ධය ඇවිළෙමින් පැවතුණේය. යුද්ධය හේතුවෙන් වන්නියේ මහත් භූමි ප්‍රදේශ සංකෝචනය වී තිබුණි. ජනතාව යුද්ධයේ කුරිරු ග්‍රහණයට හසුවී මිරිකී උන්නෝය. ඔවුහු ' නවය මාර්ගයට බටහිර පැත්තෙන් මල්ලාවිය ප්‍රධාන ස්ථානය බවට පත්කරගෙන තුණුක්කායි, යෝගපුරම්, වෙල්ලාකුලම්, වන්නේරිකුලම් යන ප්‍රදේශවලත් ' නවය මාර්ගයට නැගෙනහිරින් පුදුකුඩියිරප්පු ප්‍රදේශයේ ප්‍රධාන ස්ථානය බවට පත්කරගෙන වට්ටක්කච්චි, විසුවමඩු, පුලියම්පො-ක්කණෙ, පිරමන්දනාරු, උඩෙයාර්කට්ටු, තේණාවිල්, පේරාරු, කට්සිලුටෙමඩු, කේප්පාප්පිලව්, කුමුළමුනෙ, අලම්පිල් යන ප්‍රදේශවලත් ඉතා ළං ළංව කුඩා පැල්පත්වල සහ ටෙන්ට් ඇතුළේ වාසස්ථාන සාදාගෙන ජීවත් වූහ. කොටි සංවිධානයේ බුද්ධි අංශය පවත්වාගෙන ගිය ජාත්‍යන්තර සම්බන්ධතා කීපයක් හැර ජනතාවට බාහිර ලෝකයක් සමග සම්බන්ධ වීමට වෙනත් කිසිම මාර්ගයක් වූයේ නැත.

තරුණ වියේ පසුවන්නන්ට වන්නියෙන් පිටවීම සම්පූර්ණයෙන්ම තහනම් කර තිබුණි. උසස් අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාලයීය ප්‍රවේශය හිමිව සිටි අය සඳහාත්, විවාහ යෝජනා ස්ථිර වී සිටි යුවතියන්ට විවාහය සඳහාත් සෑහීමකට පත්විය හැකි කරුණු සහතික කිරීම ඉදිරිපත් කර කොටි සංවිධා-නයේ බුද්ධි අංශයේ අවසරය ලබා ගැනීමෙන් පසුව වන්නියෙන් බැහැර විය හැකි විය. එහෙත්, ධනය ඇති අය තම ගේ දොර, ඉඩකඩම් සහ වෙනත් වස්තූව සංවිධානය වෙත බාරදී පවුල් පිටින් බැහැරව ගියහ. කොටින්ගේ ගමන් ප්‍රවේශපත්‍ර ලබා දෙන ස්ථානවල අනුගමනය කළ ක්‍රියාමාර්ග පිළිබඳව ජනතාව බලවත් විවේචන එල්ල කළහ. ජනතාව අතරෙහි ක්‍රියාත්මක වන සටන්කාමීන් වන අපි බො-හෝ අවස්ථාවලදී කෝපයෙන් යුතුව අපගෙන් අසන ප්‍රශ්නවලට නිරුත්තරව සිටීමට සිදුවූ දුෂ්කර තත්ත්වයට පත්වූයෙමු. එයට හේතු වූයේ ඔවුන් දැන සිටි සංවිධානයේ පරිපාලන ක්‍රියාමාර්ගවල දුර්වලතා සංවිධානයේ සාමාජිකයන් වූ අප නොදැන සිටීමයි. ජනතාවගේ ප්‍රශ්න සහ සැක සංකා වගකීම් භාර අය වෙත දන්වා ඒ පිළිබඳව පැහැදිලි කිරීම් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවේ සංවිධානයේ රහසිගත කටයුතු සඳහා තෝරාගත් කීපදෙනෙකු බුද්ධි අංශය විසින් කොළඹට යවන බවට අප වෙත දැනුම් දෙනු ලැබිණි. එහි යම් සත්‍යයක්ද විය. එහෙත් එවැනි වැඩ පිළිවෙළ අවස්ථාවක් කරගෙන යමක් කමක් ඇති බොහෝ දෙනෙකු ද වන්නියෙන් පිටවී ගියහ.

පරිපාලනයෙහි මෙවැනි වැරදි අපිට වඩා ජනතාව දැන උන්නෝය. ඒ නිසා සංවිධානයේ පරිපාලන ව්‍යුහයන් පිළිබඳව ජනතාව තුළ කෝපයක් සහ නුරුස්සන බවක් ඇති විය.

'රටේ විමුක්තිය' වෙනුවෙන් තව ටික කාලයකට මේ දුෂ්කරතා දරාගෙන ඉන්න. අපි ඉක්මනින්ම රටක් දිනාගන්නවා. අපේ නායකතුමා හැකි ඉක්මනින් ඔබලාගේ දුෂ්කරතාවන්ට සහන සලස්වයි.' යනුවෙන් ජනතාවගේ සිත් වේදනාවන්වලට අපි තාවකාලික ඔසු ගල්වා අතගා සැනසුවෙමු. එහෙත් සංවිධානයේ සමහර ක්‍රියාමාර්ග සහ තීරණ සටන්කාමී වූ අපට ප්‍රහේලිකා සහ මනස අවුල්කරන ඒවා විය. අවතැන්වීම් කීපයකටම ද, මහත් වූ විනාශ විම්ලටද මුහුණ දී එදා වන්නියේ ජීවත්වූ සාමාන්‍ය දුගී ජනයා 'සීමා බළකායට' අයත් වුවන් ලෙස ද සටන්කාමීන් ලෙස ද සටන් පෙරමුණුවල ජීවිතක්ෂයට පත්වූවෝය. නමුත් ජනතාව කෙරෙහි ගිතෙශීවන්ත නායකයා වූ ප්‍රභාකරන් එම ජනතාවට යහපත් අනාගතයක් උදාකර දෙනු ඇතැයි යනුවෙන් වූ අපගේ දැඩි විශ්-වාසය සටන්කාමීන් වූ අපි බිඳක්වත් අඩුකර නොගන්තෙමු.

මතු සම්බන්ධයි